සෑම මුදල් වර්ෂයක ම (ඔක්තෝබර් 1 සිට ව්ප්තැම්බර් 30 දක්වා) එක්සත් ජනපද සංක්‍රමණ නීතියේ ප්‍රතිපාදන යටතේ සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට රැකියා පදනම් වූ සංක්‍රමණ වීසා 140,000ක් පමණ ලබා දෙයි. රැකියා පදනම් සංක්‍රමණ වීසා ප්‍රවර්ග පහකට බෙදා වෙන් කෙරේ. සමහර කලත්‍රයන් හා දරුවන්ට රැකියා පදනම් සංක්‍රමණිකයන් සමග ඒමට හෝ පසුව ඒමට හෝ හැකි වේ. රැකියා පදනම් සංක්‍රමණ වීසා ප්‍රවර්ග පහ පිළිබඳ වැඩි විස්තර usvisas.state.gov වෙබ් අඩවියෙන් බලා ගත හැකි වේ.

රැකියා පදනම් සංක්‍රමණ වීසාවක් සඳහා අයැදුම් කිරීමට usvisas.state.gov නම් වෙබ් අඩවියේ සංක්‍රමණ වීසා ක්‍රියාවලිය (Immigrant Visa Process) යටතේ ඇති පියවර අනුගමනය කරන්න. මෙම පියවර සම්පූර්ණ කිරීමෙන් පසුව වැඩිදුර කටයුතු කිරීමට මෙම වෙබ් අඩවියේ දී ඇති තොරතුරු සමග ජාතික වීසා මධ්‍යස්ථානයෙන් (NVC) දී ඇති උපදෙස් අනුගමනය කරන්න.